**ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය - 2023**

---

## 1.1 තත්ත්වාගණනය කළ මතය

ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයේ 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

## 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.
ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරිත්වය මධ්‍යස්ථානය ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.
ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (1) උප වගන්තිය ප්‍රකාරව, මධ්‍යස්ථානයේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 විගණන විෂය පථය

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදි. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.
- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවූවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදි.
- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදි.
- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් මධ්‍යස්ථානයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදි. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව් කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන්වීමට හැකිය.
- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදි.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි,පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, මධ්‍යස්ථානය ක්‍රියා කර ඇති බව,
- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,
- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

**1.5 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ**

**1.5.1 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම පිළිබඳ අභ්‍යන්තර පාලනය**

ගනුදෙනු කළමනාකාරීත්වයේ පොදු සහ නිශ්චිත අධිකාරිබලය සහිතව ක්‍රියාත්මක කිරීම, අදාළ වන වාර්තාකරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට අවශ්‍ය වන පරිදි ගනුදෙනු සටහන් කිරීම සහ වත්කම් සඳහා ගිණුම්කටයුතුභාවය පවත්වාගෙන යාම, කළමනාකාරීත්වයේ පොදු සහ නිශ්චිත අධිකාරි බලය සහිතව පමණක් වත්කම්වලට ප්‍රවේශ වීම, සටහන් කරන ලද වත්කම් සඳහා වූ ගිණුම්කටයුතුභාවය පවත්නා වත්කම් සමඟ සාධාරණ කාල වකවානුවලදී සැසඳීම සහ වෙනස්කම් ඇතොත් ඒවා සම්බන්ධයෙන් නිසි පියවර ගැනීම ආදිය සඳහා සාධාරණ තහවුරුවක් ලබාගැනීමට ප්‍රමාණවත් "මනාලෙස සැලසුම් කරන ලද" අභ්‍යන්තර ගිණුම්කරණ පාලන පද්ධතියක් මධ්‍යස්ථානය විසින් පවත්වාගෙන යාම අවශ්‍ය වේ.

**1.5.2 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම**

| අදාළ ප්‍රමිතියට යොමුව සහිතව අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක 7 හි 92 (ආ) ඡේදය ප්‍රකාරව සම්පූර්ණයෙන් ක්ෂය කරන ලද එහෙත් දැනට භාවිතා කරමින් පවතින පිරිවැය රුපියල් මිලියන 1,644ක් වූ වත්කම් මූල්‍ය ප්‍රකාශනවල වෙනම හෙළිදරව් කර නොතිබුණි. | 2023 වසරේදී ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය විසින් නිකුත් කර ඇති විශේෂ නිර්දේශය අනුව විගණනයේ සඳහන් නිර්දේශයන් තවදුරටත් වලංගු නොවන බව. | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අනුව කටයුතු කළ යුතුය. |

**1.5.3 ගිණුම්කරණ අඩුපාඩු**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) ප්‍රදාන වශයෙන් හා CRIWMP වැඩසටහන මගින් ලද රු.11,501,020 ක් වටිනා පොලිසැක්, ජීවිතාරක්ෂක කබා , කාර්යාල උපකරණ හා පරිගණක, මූල්‍ය ප්‍රකාශනවල හඳුනාගෙන තිබුණේ රු.6,978,100 ක් ලෙස වීම නිසා රු.4,522,920 ක වෙනස හඳුනාගැනිමට කටයුතු කර නොතිබුණි. | නිරීක්ෂණය හා එකඟ වන බව. | මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම නිවැරදි විය යුතුය. |

| | | |
|---|---|---|
| (ආ) කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුවට අයත් භූමියක 2010 වර්ෂයේදී රුපියල් මිලියන 1,034.39 ක් වැය කර ඉදි කරන ලද ගොඩනැගිල්ලේ වටිනාකම මූල්‍ය ප්‍රකාශනවල හදුනා නොගැනීම නිසා එම වටිනාකමින් ජංගම නොවන වත්කම් අඩුවෙන් දැක්වුණි. | ගොඩනැගිල්ල පිහිටි භූමිය පවරා ගැනීමේ කටයුතු සිදු කිරීමට නොහැකි වීම හේතුවෙන් ගොඩනැගිල්ලේ වටිනාකමද මූල්‍ය ප්‍රකාශන වල හදුනා ගැනීම ගැටලු සහගත වී ඇති බවත් ඉදිරියේදී එය නිරවුල් කර ගැනීමේ කටයුතු සිදු කර ගනු ඇති බව. | ස්ථාවර වත්කම් නිසි පරිදි හදුනාගෙන ගිණුම් ගත කල යුතුය. |

### 1.5.4 අධිකාරී බලය නොලත් ගනුදෙනු

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| නිලධාරීන්ගේ අවශ්‍යතාවයකින් සහ අන්තර්කාලීන කමිටු අනුමැතියකින් තොරව පුද්ගලික සමාගමකින් රු.424,000 ක් පිරිවැය වූ කරපටි (ටයි) 200 ක් මිලට ගෙන තිබුණි. | සේවක සුබ සාධක සංගමයේ 2023 වසරේ ගිණුම් ප්‍රකාශ සකස් කිරීමේ කටයුතු මේවන විට අවසන් වී නොමැති බව. | අධිකාරී බලය ඇතිව ගනුදෙනු වලට එළඹිය යුතුය. |

## 1.6 ලැබිය යුතු සහ ගෙවිය යුතු ගිණුම්

### 1.6.1 ලැබිය යුතු මුදල්

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2015 වර්ෂයේ සිට වැඩ තහනම් කළ නිලධාරියෙකුගෙන් අයවිය යුතු රු.256,569 ක් අයකර ගැනීමට අවශ්‍ය ක්‍රියා මාර්ග ගෙන නොතිබුණි. | අයකර ගැනීම් ප්‍රමාදයට වගකිව යුතු නිලධරයන් හදුනා ගැනීමට කමිටුවක් පත් කර ඇති අතර එහි වාර්තාවක් 2024 මැයි 03 දින වන විට ලබා දෙන ලෙස අදාල කමිටුවට දන්වා ඇති බව. | අයවිය යුතු මුදල අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |

### 1.6.2 ගෙවිය යුතු මුදල්

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2022 හා සමාලෝචිත වර්ෂයට අදාල විදුලි බිල්, ජල බිල් හා ආරක්ෂක, සනීපාරක්ෂක සේවා වෙනුවෙන් රු.24,624,432 ක මුදලක් ආපදා කළමනාකරණ අංශයට ගෙවිය යුතුව තිබුණි. | ජල විදුලි හා සනීපාරක්ෂක සේවා බිල්පත් සඳහා ආපදා කළමනාකරණ අංශය විසින් ගෙවීම් කරන අතර භාවිතයට අනුව සමානුපාතික වියදමක් අය කරනු ලැබේ. 2023 වර්ෂයට ප්‍රමාණවත් අක්මුදල් නිදහස් නොකිරීම නිසා අංශය දැනුවත් කර අඛණ්ඩ පැවැත්ම තහවුරු කිරීමට හැකියාව ලැබු බව. | ගෙවීම් කඩිනම් කල යුතුය. |

**1.6.3 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම**

| | නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරීත්ව යේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | 2018 අංක 19 දරන ජාතික විගණන පනත<br>i. 38 (ඉ) වගන්තිය | සමාලෝචිත වර්ෂය තුල නිකුත් කරන ලද විගණන විමසුමක් සඳහා මාස 06 කට ආසන්න කාලයක් ගත වි ඇතත් පිළිතුරු සපයා නොතිබුණි. | පිළිතුරු ලබා දීමට කටයුතු කරන බව. | විගණන පනත ප්‍රකාරව කඩිනමින් පිළිතුරු ලබාදිය යුතුය. |
| (ආ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය<br>i. මුදල් රෙගුලාසි 101 සහ 156 (1) | අවම සුදුසුකම් නොමැතිව හා නිවැරදි නොවන තොරතුරු සහිත ලිපිලේඛන ඉදිරිපත් කර අධ්‍යක්ෂ (අවමකිරීම්) තනතුරට පත්කල හා බඳවා ගැනීමේ පටිපාටියට අනුව අවම වශයෙන් වසර 03ක පරිවාස කාලයක් සේවය කලයුතු වුවත් එක් වර්ෂයක කාලයකින් පසු සේවය ස්ථිර කර තිබූ නිලධාරිනිය වෙත වැටුප් හා දීමනා ලෙස රු.14,163,264 ක් ගෙවා තිබුණද මුදල් රෙගුලාසි විධිවිධාන ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. | මේ සම්බන්ධයෙන් ආරක්ෂක අමාත්‍යාංශය හා නිතිපති දෙපාර්තමේන්තුව වෙතින් උපදෙස් ඉල්ලා ඇත. නිතිපති උපදෙස් අනුව ආරක්ෂක අමාත්‍යාංශයෙන් දෙන උපදෙස් පරිදි ඉදිරි කටයුතු සිදු කරන බව. | මුදල් රෙගුලාසි විධිවිධාන අනුගමනය කල යුතුය. |
| | ii. මුදල් රෙගුලාසි 507 හා 128 (1) සහ 2017 ජුනි 28 දිනැති අංක 01/2017 දරන වත්කම් කළමනාකරණ චක්‍රලේඛයේ 04 ඡේදය | මුල්‍ය ප්‍රකාශන වල රු. 444,000ක් ලෙස සඳහන් පුස්තකාල පොත් සමාලෝචිත වර්ෂය තුලදි භෞතික සත්‍යාපනයනක් සිදු කර නොතිබු අතර පරිත්‍යාග ලෙස ලද පුස්තකාල පොත්වල වටිනාකමද නිවැරදිව තක්සේරු කර මුල්‍ය ප්‍රකාශන වලට ඇතුලත් කර නොතිබුණි. | 2023 වර්ෂයේ සිට පුස්තකාලය සතුව පවතින මිල දී ගනු ලබන පොත් ද වාර්ෂික භාණ්ඩ සමීක්ෂණය මගින් පරීක්ෂා කර පොත්වල සුරක්ෂිතභාවය පිළිබඳව තවදුරටත් සත්‍යාපනයක් සිදු කිරීමට කටයුතු කරන බව. | මුදල් රෙගුලාසි හා චක්‍රලේඛ විධිවිධානයන් අනුගමනය කල යුතුය. |
| (ඇ) | 2021 නොවැම්බර් 16 දිනැති අංක 01/2021 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය සමඟ නිකුත් කරන ලද මෙහෙයුම් අත්පොත<br>6.6 ඡේදය | 2023 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන සමඟ ඉදිරිපත් කරන ලද කෙටුම්පත් වාර්ෂික වාර්තාව, මාර්ගෝපදේශයේ මඟපෙන්වීම් ප්‍රකාරව පිළියෙල කර නොතිබුණි. | 2023 වාර්ෂික වාර්තාව නැවත සංශෝධනය කරමින් පවතින බව. | චක්‍රලේඛයේ මාර්ගෝපදේශ යේ මඟපෙන්වීම් අනුගමනය කල යුතුය. |
| (ඈ) | 2013 ඔක්තෝබර් 24 දිනැති අංක TA | විදේශ සම්පත් දෙපාර්තමේන්තුවේ අනුදැනුමකින් තොරව 2023 | විගණනයෙන් පෙන්වා දී ඇති | චක්‍රලේඛය ප්‍රකාරව |

| | | | | |
|---|---|---|---|---|
| | Circular 2013/2014 (ii) දරන මහා භාණ්ඩාගාර චක්‍රලේඛය | වර්ෂයේදි විදේශීය හවුල්කරුවන් පස්දෙනෙකු අනුග්‍රහය දැක්වූ විදේශ පුහුණු, වැඩමුළු, සම්මන්ත්‍රණ සහ සංචාර 05 ක් සඳහා ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයේ නිලධාරීන් අටදෙනෙකු අන්තර්කාලීන කමිටු අනුමැතියකින් තොරව සකස්කර තිබු තෝරාගැනිමේ ක්‍රමවේදයකට අනුව තෝරාගෙන රු.486,691 ක පිරිවැයක් දරා සහභාගි කරවා තිබුණි. | කරුණු අනුව ඉදිරියේදී විදේශ සම්පත් දෙපාර්තමේන්තුව මඟින් යොමු නොකරන විදේශ වැඩසටහන් සඳහා ඉදිරිපත් කරන නාම යෝජනාවන්හි පිටපත් අමාත්‍යාංශය හරහා විදේශ සම්පත් දෙපාර්තමේන්තුව වෙත යොමු කිරිමට කටයුතු කරන බව. | කටයුතු කල යුතුය. |
| (ඉ) | 1994 අප්‍රේල් 20 දිනැති අංක 30/94 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛයේ 5.7.2 ඡේදය | ශිෂ්‍යත්ව ලාභින් හා අභ්‍යාස ලාභින් පිළිබඳ වාර්තා විගණකාධිපතිටද පිටපතක් සහිතව විදේශ සම්පත් අධ්‍යක්ෂ ජනරාල් වෙත ඉදිරිපත් කර නොතිබුණි. | 2007 වර්ෂයේ සිට ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයේ නිලධාරින් විදේශ පුහුණු වැඩසටහන් සඳහා යොමු කර ඇත. ඒ ඒ වැඩසටහනට අදාළව ආරාධනය යොමු කරනු ලබන ආයතන විසින් නිකුත් කරනු ලබන නිර්ණායකයන් ආදිය ඇතුළත් දත්ත පද්ධතියකින් ප්‍රමුඛතා ගත කර ඇති බව. | චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කල යුතුය. |
| (ඊ) | 2019 ජූලි 25 දිනැති අංක SC&PMU/Grant/19 දරන විදේශ සම්පත් දෙපාර්තමේන්තු චක්‍රලේඛයේ 03, 04 ඡේද | 2023 වර්ෂය තුල ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයට සංවිධාන 8කින් ලැබී තිබූ රු.54,850,969 ක අනුග්‍රහය සම්බන්ධව මෙම චක්‍රලේඛයේ විධිවිධාන අනුව කටයුතු කර නොතිබූ අතර විදේශ ප්‍රදාන මගින් ක්‍රියාත්මක කිරීමට අපේක්ෂිත වැඩසටහන් පිළිබඳ සැලැස්මක්ද මධ්‍යස්ථානය සතුව නොතිබුණි. | මධ්‍යස්ථානය වෙත ලබා ගන්නා සියළුම විදේශ ප්‍රදාන විදේශ සම්පත් දෙපාර්තුමේන්තු වේ අනුමැතිය මත නිසි ක්‍රමවේදයකට හා නිසි සැලසුමකට අනුව මින් ඉදිරියට කටයුතු කරන බව | චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කල යුතුය. |

## 1. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රුපියල් මිලියන 11.54 ක ඌනතාවයක් වූ අතර ඊට අනුරූපිව ඉකුත් වර්ෂයේ ඌනතාවය රුපියල් මිලියන 44.75ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රුපියල් මිලියන 33.21 ක වර්ධනයක් නිරීක්ෂණය විය.

## 2. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 අනාර්ථික ගනුදෙනු

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2005 අංක 13 දරන ශ්‍රී ලංකා ව්‍යසන කළමනාකරණ පනතේ 8(ඊ) ඡේදය යටතේ මධ්‍යස්ථානයේ එක් කාර්යයක් ලෙස ආපදා අවදානම් අවම කිරීම සඳහා සකස් කළ පර්යේෂණ වාර්තා පිටපත් 100 ක් රටේ ආර්ථික සංවර්ධනයට හෝ ක්‍රම සම්පාදනය කිරීමට හෝ මහා භාණ්ඩාගාරයේ ප්‍රයෝජනයට භාවිතා කර නොතිබීම හේතුවෙන් ඒ සඳහා වැය කළ රු.4,200,000 ක මුදල අනාර්ථික වියදමක් වී තිබුණි. | රු.4,200,000 වැය කොට ඇත්තේ සිතියම් මුද්‍රණය හා පොත් 100 මුද්‍රණය සඳහා මිලියන 1.8 ක් හා ග්‍රාම නිලධාරි කොට්ඨාස මට්ටමින් තොරතුරු රැස් කිරීම සඳහා , විශ්ව විද්‍යාල පුහුණු වන සිසුන් සඳහා දිනක රු. 500 බැගින් වන දීමනාව ගෙවීම යන කටයුතු සඳහා වේ. එබැවින් මෙම මුදල අනාර්ථික වියදමක් ලෙස නම් කිරීම පදනම් විරහිත බව. | දරනු ලබන වියදම් ප්‍රතිඵලදායි විය යුතුය. |

### 3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2005 අංක 13 දරන ශ්‍රී ලංකා ව්‍යසන කළමනාකරණ පනත සංශෝධනය කරන තුරු 2012 ජූලි 05 දින අංක අමප/12/0790/548/004 දරන අමාත්‍ය මණ්ඩල පත්‍රිකාවෙන් අන්තර්කාලීන කළමනාකරණ කමිටුව ස්ථාපිත කිරීම සඳහා අනුමැතිය ලබා දී තිබුණද වසර 10කට වැඩි කාලයක් ගත වී ඇතත් පනතේ අවශ්‍ය සංශෝධන කටයුතු සිදු කර නොතිබුණි. | පනත සංශෝධනය කිරීමේ කටයුතු ආපදා කළමනාකරණ අංශය මගින් සිදු කරමින් සිටින අතර මේ වනවිට නීතිපති දෙපාර්තුමේන්තුවේ නිරීක්ෂණ සඳහා යොමු කර ඇති බව. | පනතෙහි සංශෝධන සිදු කර පාර්ලිමේන්තු අනුමැතිය ලබා ගැනීමට කටයුතු කල යුතුය. |
| (ආ) | 2005 අංක 13 දරන ශ්‍රී ලංකා ව්‍යසන කළමනාකරණ පනතේ 04 වගන්තිය අනුව මධ්‍යස්ථානයේ ප්‍රධානම කාර්යයක් වන ජාතික හදිසි අවස්ථා මෙහෙයුම් සැලැස්ම සකස් කර අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබා ගෙන නොතිබුණි. | ජාතික හදිසි මෙහෙයුම් සැලැස්ම කෙටුම්පත් කර අවසන් කෙටුම්පත වශයෙන් සැකසීම 2023 දෙසැම්බර් 31 දින වන විටත් සිදුකර තිබූ නමුත් සෝදුපත් බලා එහි දල පිටපත් මුද්‍රණය කර නොමැති වීම හේතුවෙන් අමාත්‍ය මණ්ඩලය සඳහා ඉදිරිපත් කිරීමට නොහැකි වූ බව. | ජාතික හදිසි අවස්ථා මෙහෙයුම් සැලැස්ම සකස් කර අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබා ගත යුතුය. |

| | | |
|---|---|---|
| (ඇ) සමාලෝචිත වර්ෂය අවසානයට මධ්‍යස්ථානයේ පුරප්පාඩු තනතුරු සංඛ්‍යාව 169 ක් වූ අතර මෙම පුරප්පාඩුවලින් අත්‍යවශ්‍ය තනතුරු 05ක් වසර ගණනාවක සිට පැවතීමෙන් මධ්‍යස්ථානයේ කටයුතු කාර්යක්ෂමව හා ඵලදායීව කරගෙන යාමට බාධාවක් වී තිබුණි. | අංක 21/1596/304/134 දරණ අමාත්‍ය මණ්ඩල තීරණය මත බඳවා ගැනීම් සිදු කිරීම නතර කිරීම හේතුවෙන් බඳවා ගැනීම් සිදු කිරීම ප්‍රමාද වීම සිදු වී ඇති බව. | පුරප්පාඩු සම්පූර්ණ කර මධ්‍යස්ථානයේ කටයුතු කාර්යක්ෂමව පවත්වාගෙන යායුතුය. |
| (ඇ) ව්‍යසන කළමනාකරණය සඳහා වූ ජාතික සභාවේ අනුමැතිය ලබා ගැනීමට යටත්ව විශ්‍රාමික යුධ හමුදා නිලධාරියකු එක් වසරක කොන්ත්‍රාත් පදනම මත 2020 ජනවාරි 15 දිනැති අංක අමප/19/3498/203/008 දරන අමාත්‍ය මණ්ඩල තීරණයෙන් අධ්‍යක්ෂ ජනරාල් තනතුරට පත්කර තිබුණද අමාත්‍ය මණ්ඩල තීරණය සඳහා පදනම් වූ අනුමැතිය එකී යටත්ව මෙතෙක් ලබා ගෙන නොතිබුණි. | 2020 වර්ෂයේ සිට මේ දක්වා ව්‍යසන කළමනාකරණ සභාව රැස්වී නොමැති අතර එම සභාව රැස් කිරීමට අදාළ කටයුතු ආරක්ෂක අමාත්‍යාංශයේ ආපදා කළමනාකරණ අංශය විසින් සිදු කරනු ලබන බව. | නිසි අධිකාරී බලය ඇතිව කටයුතු කල යුතුය |

**3.3 මෙහෙයුම් අකාර්යක්ෂමතා**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) දිස්ත්‍රික් ආපදා කළමනාකරණ ඒකකවලට තාවකාලිකව ලබාදී ඇති රු.4,317,955 ක් වටිනා හදිසි ආපදා ප්‍රතිචාර දැක්වීමේ උපකරණ 153 ක් ආපදා තත්ත්වයකදී ප්‍රයෝජනයට ගත හැකි වන පරිදි නැවත ගෙන්වා ගැනීමට කටයුතු කර නොතිබුණි. | අධ්‍යක්ෂ ජනරාල් තුමාගේ අනුමැතිය මත සුදුසු ආයතනය වෙත අවශ්‍ය උපකරණ තාවකාලික පදනම මත ලබාදී ඇත. එම උපකරණ ක්‍රියාකාරී තත්වයේ පවත්වාගෙන යන්නේද යන්න සහ, නිවැරදිව අදාල ස්ථානයේ තබා තිබේද යන්න පිළිබඳව නිරතුරු සොයාබැලීම්, දිස්ත්‍රික් ආපදා කළමනාකරණ සම්බන්ධීකරණ ඒකක හරහා ප්‍රධාන කාර්යාලය විසින් සිදු කරනු ඇති බව. | තවකාලිකව ලබාදී ඇති උපකරණ එකඟ වූ පරිදි ගෙන්වා ගැනීමට හෝ ස්ථිරව නිකුත් කිරිමට කටයුතු කල යුතුය. එසේම මෙම ලබා දී ඇති උපකරණ පිළිබඳ වාර්ෂික භාණ්ඩ සමීක්ෂණය මගින් තහවුරු කිරීමද සිදුකල යුතුය. |
| (ආ) මධ්‍යස්ථානය 2011 වසරේ සිට 2023 දක්වා කාලය තුල රු.3,247,761,559 ක වියදමක් ආපදා අවම කිරීමේ ව්‍යාපෘති සඳහා දරා ඇතත් ගංවතුර, නායයෑම්, දැඩි සුළං තත්ව හේතුවෙන් 2022 හා 2023 වසර වල පීඩාවට පත් පුද්ගලයින් සංඛ්‍යාව 235,389 ක් වීම නිසා ඉන් ලැබී ඇති ප්‍රතිඵලය අල්ප වී තිබූ බව නිරීක්ෂණය විය. | ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයේ වසර 13 ක් තුල ලැබී ඇති ආපදා අවම කිරීමේ ප්‍රතිපාදන තුලින් පමණක් ආපදාවන්ගෙන් පීඩාවට පත්වන පුද්ගල සංඛ්‍යාව අඩුකල නොහැකි බවත් මේ සඳහා බලපානු ලබන සමාජ, ආර්ථික හා පුද්ගල බද්ධ කරුණු බොහෝමයක් ඇති බව. | ආපදා අවම කිරීමේ ව්‍යාපෘති තුලින් අපේක්ෂිත ප්‍රතිඵල ලබා කර ගත යුතුය. |

## 3.4 අරමුදල් ඌන උපයෝජනය

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ව්‍යසන කළමනාකරණ පනතේ 8 (ඇ) හා (ඉ) යටතේ ආපදා වැලැක්වීමේ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම හා ඇගයීම මධ්‍යස්ථානයේ වගකීම වුවත් සමාලෝචිත වර්ෂයේදී රුපියල් මිලියන 162 ක ප්‍රතිපාදනවලින් ආපදා අවම කිරීමේ ව්‍යාපෘති 88ක් ක්‍රියාත්මක කිරීමට සැලසුම් කර තිබුණද එයින් රුපියල් මිලියන 44ක ව්‍යාපෘති 29ක් ක්‍රියාත්මක කර නොතිබුණි. | රු. 43,657,879 ක් වන ආපදා අවම කිරීමේ ව්‍යාපෘති යෝජනා 29ක් වර්ෂය පුරා පැවති අධික වර්ෂාමය තත්ත්වය, වෙනත් ව්‍යාපෘතීන් ක්‍රියාත්මක කිරීම මත පැවති ආපදා තත්ත්වයන් පහව යාම, වෙනත් ආයතන මඟින් ප්‍රතිපාදන වෙන්කර ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම හා නව ඇස්තමේන්තු සැකසීමේ දී ලබා දී ඇති ප්‍රතිපාදන ප්‍රමාණවත් නොවීම වැනි විවිධ හේතූන් මත අවලංගු කිරීමට සිදු වී ඇති බව. | සැලසුම් කල පරිදි ව්‍යාපෘති ක්‍රියාත්මක කර අපේක්ෂිත ප්‍රතිඵල ලබා කර ගත යුතුය. |

## 3.5 නිෂ්කාර්ය හෝ ඌන උපයෝජිත දේපල, පිරියත හා උපකරණ

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ආපදා අවම කිරීමේ අංශය විසින් දිස්ත්‍රික්ක 6 ක රුපියල් මිලියන 233.9 ක වියදම් දරා ක්‍රියාත්මක කරන ලද ඉදිකිරීම් ව්‍යාපෘති 8 ක් අසාර්ථක වී, ඌන උපයෝජිතව පැවතුණි. | ක්‍රියාත්මක කරන ලද ව්‍යාපෘති ඌණ උපයෝජිතව නොමැති අතර ව්‍යාපෘතිවල භාවිතය සම්බන්ධයෙන් වන තහවුරුව හා වැඩ අවසන් කිරීමේ වාර්ථා මඟින් තහවුරු කොට ඇති බව. | ආපදා අවම කිරීමේ ව්‍යාපෘති තුලින් අපේක්ෂිත ප්‍රතිඵල ලබා කර ගත යුතුය. |

## 3.6 ප්‍රසම්පාදන කළමනාකරණය

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශ |
|---|---|---|---|
| (අ) | මුළු ඇස්තමේන්තු පිරිවැය රුපියල් මිලියන 39.17ක් වූ , මදුරන්කුලිය කඩයාමොට්ටේ අයෙකුගේ නිවස අසල කාණුව බෝක්කුවට සම්බන්ධ කිරීමේ ව්‍යාපෘතියට අදාල ප්‍රසම්පාදනයේදි සීඩා ශ්‍රේණි C-5 සහ C-4 ලියාපදිංචිය සහිත කොන්ත්‍රාත්කරුවන්ගෙන් ලංසු කැඳවිය යුතු වුවත් C-5 හෝ C-6 සහිත කොන්ත්‍රාත්කරුවන්ගෙන් ලංසු කැඳවා තිබුණි. තවද නිසි අධ්‍යයනයකින් තොරව අධි ඇස්තමේන්තු සකස් කිරීම නිසා ලබා දී තිබූ ප්‍රතිපාදනවලින් රුපියල් මිලියන 15.7 ක මුදලක් ඌන උපයෝජිතව නැවත පවරා ගෙන තිබුණි. | ප්‍රසම්පාදන කටයුතු ප්‍රසම්පාදන මාර්ගෝපදේශ අනුව කටයුතු කල යුතු බවට දිස්ත්‍රික් ලේකම් වෙත ආපදා අවම කිරීමේ මාර්ගෝපදේශ මඟින් දැනුම් දි ඇති බව. | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය සහ ඊට නිකුත් කල අතිරේඛ ප්‍රකාරව කටයුතු කල යුතු අතර ව්‍යාපෘති ඇස්තමේන්තු නිවැරදිව පිළියෙල කල යුතුය. |
| (ආ) | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 2.8.4 ජේදයට අනුකූල නොවන ලෙස රුපියල් මිලියන 19.76 ක් | පිළිතුරු ඉදිරිපත් කර නොතිබුණි. | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය අනුව |

| | | |
|---|---|---|
| පිරිවැය වූ හලාවත දිස්ත්‍රික්කයේ මයික්කුලම හා සවරාන ග්‍රාම නිළධාරි වසම්වල ගංවතුර ආපදා අවම කිරීමේ ව්‍යාපෘතිය සඳහා වන තාක්ෂණික ඇගයීම් කමිටුවට පත්කල සාමාජිකයින් තිදෙනාම පුත්තලම දිස්ත්‍රික් ලේකම් කාර්යාලයෙන් පත් කර තිබුණි. තවද මෙම ව්‍යාපෘතිය යටතේ සංවෘත කාණුව, තිඹිල්ල ඇල හා අවරංකුලිය ඇල හරහා අමුණු ඉදිනොකිරීම හේතුවෙන් ව්‍යාපෘතියේ අරමුණ ඉටු නොවී තිබුණු බැවින් ව්‍යාපෘතිය සඳහා වැය කළ රුපියල් මිලියන 1.4 ක මුදලද නිශ්කාර්ය වියදමක් වී තිබුණි. | | කටයුතු කල යුතු අතර ව්‍යාපෘති සම්පූර්ණ ලෙස ක්‍රියාත්මක කර අපේක්ෂිත ප්‍රතිලාභ ලබා ගත යුතුය. |

**3.7 කොන්ත්‍රාත් පරිපාලනයේ අඩුපාඩු**

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | පිරිවැය රුපියල් මිලියන 21.66 ක් වූ නුවරඑළිය දිස්ත්‍රික්කයේ වලපනේ ගංගාරගොල්ල ගමෙහි ගල් පෙරලීමේ හා නායයෑමේ අවධානම අවම කිරීමේ ව්‍යාපෘතිය එක් ලංසුවක් මත පිරිවැය රුපියල් මිලියන 18.47 ක් වූ මහනුවර දිස්ත්‍රික්කයේ අකුරණ ගංවතුර ආපදා තත්ත්වය අවම කිරීමේ ව්‍යාපෘතිය අසාර්ථකව සිදු කල කොන්ත්‍රාත්කරුටම ප්‍රදානය කර තිබුණි. ව්‍යාපෘතියේ අරමුණ ඉටු නොවී තිබූ අතර ලබාදුන් රු.904,720 ක කාර්යසාධන සුරක්ෂණයේ නිරවද්‍යාභාවය බැංකුවෙන් සනාථ කර ගෙන නොතිබුණි. එමෙන්ම ඉංජිනේරු සැලැස්ම නිශ්චිත ආකෘතියේ පිළියෙල කර නොතිබූ අතර වරලත් සිවිල් ඉංජිනේරුවරයකු සහතික කරද නොතිබුණි. | මේ සම්බන්ධව නුවරඑළිය දිස්ත්‍රික් ලේකම්ගෙන් සිදු කල කරුණු විමසීමේදී ව්‍යාපෘතියට අදාල තාක්ෂණික ඇගයීම් කමිටු නිලධාරීන් පත් කර තිබූ බවත් දිස්ත්‍රික් ආපදා කළමනාකරණ සම්බන්ධීකරණ ඒකකයේ සහකාර අධ්‍යක්ෂවරයා එහි සාමාජිකයෙක් බව හා ජාතික ගොඩනැඟිලි පර්යේෂණ සංවිධානය විසින් ලබා දෙන ලද සැලසුම් හා උපදෙස් අනුව අදාල ඉදිකිරීම් සිදු කර ඇති බවත් විගණනය පෙන්වා දී ඇති පරිදි ඉදිරි ව්‍යාපෘතිවලදී නිවැරදි කර ගැනීමට කටයුතු කරන බව. | කොන්ත්‍රාත් පරිපාලනය නිසි පරිදි කල යුතුය. |
| (ආ) | කළුතර දිස්ත්‍රික්කයේ මැණික්ගොඩ ඇල ප්‍රතිසංස්කරණය අදියර 11 ව්‍යාපෘතියේ ප්‍රතිපාදිත මුදලට වැඩ අවසන් කර නොතිබියදී කොන්ත්‍රාත්කරුවන ගොවි සංවිධානය රු.2,372,032 ක ව්‍යාජ බිල්පත් ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් එම සංවිධානයට එරෙහිව අවශ්‍ය ක්‍රියාමාර්ගයන් ගෙන නොතිබුණි. | බිල්පත් ප්‍රතික්ෂේප කොට ගෙවීම්කර නොමැත. මේ පිළිබඳව කළුතර දිස්ත්‍රික් ලේකම් වෙත ආරක්ෂක අමාත්‍යාංශය මඟින් දැනුම් දී ඇති අතර දිස්ත්‍රික් ලේකම් අදාල ප්‍රාදේශීය ලේකම් දැනුවත් කොට ඇති බව. | කොන්ත්‍රාත් පරිපාලනය නිසි පරිදි සිදු කල යුතුය. |
| (ඇ) | ඇස්තමේන්තු වටිනාකම රු.3,800,000 ක් වූ මැණික්ගොඩ ඇල ප්‍රතිසංස්කරණය අදියර 11 ව්‍යාපෘතියේ අවස්ථා ගණනකදීම දිස්ත්‍රික් ආපදා | ව්‍යාපෘතියේ වැඩ කටයුතු කිරීම පිළිබඳව දිස්ත්‍රික් ආපදා කළමනාකරණ ඒකකය හා දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් වරින්වර පරීක්ෂා කළ බවද ව්‍යාපෘතියේ වැඩ | කොන්ත්‍රාත් පරිපාලනය නිසි පරිදි කල යුතුය. |

| | | | |
|---|---|---|---|
| | කළමනාකරණ ඒකකයේ නිලධාරීන්ගේ මෙන්ම මධ්‍යස්ථානයේ නිලධාරීන්ගෙන්ද වූ අතපසුවීම්, රාජකාරිමය නොසැලකිල්ල, ප්‍රමාද දෝෂ, හා අනවධානය නිසා මෙම ව්‍යාපෘතිවලින් අපේක්ෂා කළ අරමුණට ලඟා වී නොතිබුණ අතර ඉන් අත්වන වාසි පොදු මහජනතාවට ලබා ගත නොහැකිව මඟ හැරී තිබුණි. | කටයුතු නිසි පරිදි සිදු නොවන බවට තහවුරු වූ බව දන්වා නොමැති බව. | |
| (ඈ) | පිරිවැය රුපියල් මිලියන 18.91ක් දරන ලද ගංගාරගොල්ල ගමෙහි ගල් පෙරලීමේ අවධානම අවම කිරීමේ ව්‍යාපෘතියේ ඉදිකිරීම් භෞතිකව පරීක්ෂා කිරීමේදී පිරිවැය රුපියල් මිලියන 12.3ක් වූ කාණු සම්පූර්ණයෙන්ම ගැලවී යාමෙ අවදානමක් පැවතීම, කාණුවල කම්බි මල කෑමට ලක් වීම, රැඳවුම් වේල්ලෙහි උස මිලි මීටර 420ක් අඩුවෙන් ඉදි කර තිබීම සහ පිරිවැය රුපියල් මිලියන 5.9ක් වූ දෙවන රැඳවුම් කාණුවේ බෑවුම් දෙසට ඇති පැති බිත්තිය පස් පිරවීමට ලක්කර නොතිබීම, පැති බිත්තියේ ඝනකම මිලි මීටර 10ක් අඩුවෙන් ඉදිකර තිබීම සහ තුන්වන ආනත කලාපය තුල කාණුවේ මීටර 2ක පළල නොතිබීම හේතුවෙන් මෙම ව්‍යාපෘතිය අසාර්ථක වි තිබුණි. | පෙන්වා ඇති ස්ථානය දැඩි බෑවුම් සහිත ස්ථානයක් බැවින් එම කොටස පස් පුරවා ආරක්ෂා කිරීම අපහසු බවත් ඉංජිනේරු උපදෙස් මත සිදු කරන ලද බව දන්වන අතර විගණනය පෙන්වා දී ඇති අඩුපාඩු නිවැරදි කිරීමට කටයුතු කල බව | කොන්ත්‍රාත් පරිපාලනය නිසි පරිදි කල යුතුය. |
| (ඉ) | මාතර වැලිගම නිවසක් ආසන්නයේ අධික වර්ෂාව සමග පස්කඳු කඩා වැටීම වැළැක්වීම සඳහා රැඳවුම් බැම්මක් ඉදි කිරීමට ප්‍රතිපාදන ලබා දී තිබුණද, සත්‍ය ආපදා අවදානම් තත්ත්වය මත පදනම් නොවී ඉදිකිරීම් ආරම්භ කර අතරමග නවතා දැමීම නිසා රු.464,645 ක අනාර්ථික වියදමක් දරා තිබුණි. | මහාභාණ්ඩාගාරය මගින් ලබාදී ඇති මාර්ගෝපදේශ චක්‍රලේඛය අනුව ව්‍යාපෘතියේ අවදානම අවම වන තත්ත්වයකට කටයුතු කොට ව්‍යාපෘතිය අත්හිටුවා ඇති බව. | ආපදා අවම කිරීමේ ව්‍යාපෘති තුලින් අපේක්ෂිත ප්‍රතිඵල ලඟා කර ගත යුතුය. |
| (ඊ) | මහනුවර දිස්ත්‍රික්කයේ මිනිපේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ බොරළුපොත වැඩිහිටි නිවාස භූමියක අවදානම් ගල් ඉවත් කිරීම හා පැති බැම්ම ඉවත් කිරීම සඳහා රුපියල් මිලියන 2.2 ක මුදලක් ගෙවා තිබුණද, ව්‍යාපෘතිය ආරම්භ කිරීමට ප්‍රථම ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානයේ වාර්තාවක් ලබා නොගෙන කටයුතු කිරිම නිසා අවදානම් ගල් ඉවත් කිරීමේදී තවත් ගල් | මේ පිළිබඳව මහනුවර දිස්ත්‍රික් ලේකම්ගෙන් විමසීම් සිදු කර ඇති අතර පිළිතුරු ලද පසු ඒ පිළිබඳව දැනුම් දෙන බව. | කොන්ත්‍රාත් පරිපාලනය නිසි පරිදි කල යුතුය. |

ඉහලින් පහළට පෙරලීම හේතුවෙන් මුළු ප්‍රතිපාදිත මුදලම ගල් කඩා ඉවත් කිරීමට පමණක් ගෙවා පැති බැම්ම ඉවත් කිරීම සිදු වී නොතිබුණි. ව්‍යාපෘතිය සම්පූර්ණයෙන්ම ක්‍රියාත්මක නොකිරීම නිසා ව්‍යාපෘතිය තුලින් අපේක්ෂිත අරමුණ ලගා කර ගත නොහැකි වී තිබුණි.

**3.8 මානව සම්පත් කළමනාකරණය**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| මධ්‍යස්ථානයේ අධ්‍යක්ෂ ජනරාල් තනතුර සහ අධ්‍යක්ෂ (මෙහෙයුම්) තනතුර සඳහා අනුමත බඳවා ගැනීමේ පරිපාටියේ සඳහන් සුදුසුකම් සහ පළපුරුද්ද සහිත නිලධාරීන් බඳවා නොගෙන හමුදා නිලධාරීන් අනුයුක්ත කර තිබුණි. | ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය අධ්‍යක්ෂ (මෙහෙයුම්) තනතුර ආරම්භයේ සිටම ත්‍රිවිධ හමුදා නිලධාරියෙකු අනුයුක්ත කර ගනිමින් පවත්වා ගෙන ගොස් ඇති අතර ඒ සඳහා ව්‍යසන කළමනාකරණය සඳහා ජාතික සභාවේ සහ අන්තර්කාලීන කළමනාකරණ කමිටුවේ අනුමැතිය පවතින බව. | බඳවා ගැනීමේ පරිපාටියේ අවශ්‍ය සංශෝධන සිදු කල යුතුය. |

**4. ගිණුම්කටයුතුභාවය සහ යහපාලනය**

**4.1 වාර්ෂික වාර්තා පාර්ලිමේන්තුවේ සභාගත කිරීම**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| මධ්‍යස්ථානය විසින් 2022 වර්ෂයේ වාර්ෂික වාර්තාව 2024 මාර්තු 15 දින වන විටත් පාර්ලිමේන්තුවේ සභාගත කර නොතිබුණි | 2022 වාර්ෂික වාර්තාව 2024 මාර්තු 21 දින පාර්ලිමේන්තුවේ සභාගත කිරීම සඳහා භාරදෙන ලද බව. | වාර්ෂික වාර්තාව පාර්ලිමේන්තුවේ සභාගත කිරීමට කටයුතු කල යුතුය. |

**4.2 කළමනාකරණ තොරතුරු පද්ධතියේ ඵලදායීත්වය**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2019 වර්ෂයේ සිට 2022 වර්ෂය දක්වා කාලය තුල රු.9,011,500 ක් වැයකර ව්‍යසන කළමනාකරණය පිළිබඳ දත්ත සමුදායක් සංවර්ධනය කර තිබුණද එය ප්‍රයෝජනයට නොගෙන ඌන | දත්ත පද්ධති ඌණ උපයෝජිතව පැවති බව පිළිගත නොහැකි වන අතර දත්ත මත පදනම්ව තීරණ ගන්නා වෙනත් ආයතන මෙම දත්ත සඳහා ඉල්ලීම් කරනු ලබන අතර මෙම මධ්‍යස්ථානය තුලද මෙම | දත්ත සමුදාය ඵලදායි ලෙස ප්‍රයෝජනයට ගත යුතුය. |

| | |
|---|---|
| උපයෝජිතව පැවතුණි. | දත්ත භාවිතයට ගනු ලබන බව. |

**4.3** **අභ්‍යන්තර විගණනය**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2005 අංක 13 දරණ ව්‍යසන කළමනාකරණ පනතේ ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයට පැවරී ඇති ජාතික කාර්යභාරය ඵලදායී ලෙස නියාමනය හා ඇගයීමට අවශ්‍ය දැනුම හා කුසලතා මට්ටමට ගැලපෙන පරිදි අභ්‍යන්තර විගණනය පුළුල් විය යුතු නමුත් මධ්‍යස්ථානයේ අභ්‍යන්තර විගණන අංශය සඳහා විගණන නිලධාරීන් දෙදෙනෙක් පමණක් අනුයුක්ත කර තිබූ බැවින් මධ්‍යස්ථානයේ කටයුතු ප්‍රමාණවත් පරිදි ආවරණය වන පුළුල් විගණනයක් සිදු වී නොතිබුණි. මේ පිළිබඳව 2013, 2014 සහ 2015 වර්ෂවලදීද විගණකාධිපති වාර්තා තුලින් පෙන්වා දී තිබුණද මෙතෙක් ක්‍රියා මාර්ගයක් ගෙන නොතිබුණි. | අදාළ කටයුතු සිදු කරමින් පවතින බව. | අභ්‍යන්තර විගණනය සඳහා නිලධාරීන් බඳවා ගෙන ශක්තිමත් අභ්‍යන්තර පාලනයක් පවත්වාගෙන යා යුතුය. |